CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

## *මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන්වහන්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගැන දක් වූ අදහස් පිළිබඳ අපගේ ප්‍රකාශනය - 2017.11.02*

2017 ඔක්තෝම්බර් 28 වන සෙනසුරාදා දින 'අද දෙරණ' සහ 'හිරු' රූපවාහිනී නාලිකාවල රාත්‍රී ප්‍රවෘත්ති ප්‍රකාශයන් අතරතුර දී මාහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන්වහන්සේ විසින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගැන යම් අදහසක් පළ කරන ආකාරය විකාශනය වුණි. රත්මලාන ධම්මිකාරාමයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයකදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය නිර්මාණය සහ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය සඳහා අරමුදල් සැපයීම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂක ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා කටයුතු කරන බව එකී ප්‍රකාශනයෙන් කියැවුණි. එකී ප්‍රකාශනයට අදාළ වාර්තාවක් නොවැම්බර් 01 වන දින දිනපතා ලංකාදීප පුවත්පතේ 15 වන පිටුවේ ද පළ විය. ප්‍රථමයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් බෙල්ලන්විල විමලරතන ස්වාමීන් වහන්සේගේ ප්‍රකාශය තරයේ ප්‍රතික්ෂේප කර සිටින්නෙමු.

මෙරට ජනතාවගේ අතිශය ගෞරවයට පාත්‍ර වූ භික්ෂූන් වහන්සේ නමක් වන බෙල්ලන්විල විමලරතන ස්වාමීන්වහන්සේ අවාසනාවකට මෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලියට විරුද්ධ කොටස් සමඟ එක්ව සිටින ආකාරයක් පෙනෙන්නට තිබේ. එවැනි විරුද්ධ කණ්ඩායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට සහය ලබාදෙන්නන් දේශ ද්‍රෝහීන් ලෙස නම් කරමින් ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වන්නන්ට මරණ තර්ජන එල්ල කරන අතර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ සම්මත වන්නේ නම් පාර්ලිමේන්තුවට බෝම්බ දැමිය යුතු යැයි ඇතැමුන් ප්‍රකාශ කරයි. එවැනි සන්දර්භයක බෙල්ලලන්විල හිමියන්ගේ ප්‍රකාශය පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ ජනනය වන්නේ අප්‍රසන්නතාවක් සහ කණගාටුවකි.

තවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ විධායක අධ්‍යක්ෂකවරයා සම්බන්ධ වූවේ යැයි කියන ක්‍රියාවලියට අදාළ ව කිසිදු සාක්ෂියක් ගෞරවනීය ස්වාමීන් වහන්සේ ඉදිරිපත් නොකරයි.

ගෞරවනීය ස්වාමීන් වහන්සේ විසින් සිදු කරන ලද ප්‍රකාශය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දකින්නේ, වගකීම් විරහිත මෙන් ම  විනාශකාරී අන්තයන් කරා ගමන් කකිරීමට තුඩු දිය හැකි ප්‍රකාශයක් ලෙස ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2008 දී කළු ජූලියට වසර 25ක් සපිරීම නිමිත්තෙන් මහජන දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වනු ලැබිණ. ලාංකීය සියලු පුරවැසියන් අතර සාමකාමී සහජීවනය සහ අහිංසාව තේමා කරගනිමින් පැවැත් වූ එම වැඩසටහනට ගෞරවනීය දායකත්වයක් සැපයූ ස්වාමීන් වහන්සේ විසින් ම මෙවැනි ප්‍රකාශයක් සිදු කිරීම පිළිබඳ ඇත්තේ විමතියකි.

ශ්‍රී ලංකාවේ යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම උදෙසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 1996 සිට විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන අතර  නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අපේක්ෂාව මත පුළුල් මහජන කතිකාවක් ඇතිකිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් සහ පර්යේෂණයන් සිදු කරමින් සිටින්නෙමු. කරුණු විකෘති කිරීම්, වෛරී සහගත ප්‍රකාශන සහ ද්වේෂ සහගත ක්‍රියාවන්ගෙන් තොරව ව්‍යවස්ථා කතිකාව ඉදිරියට ගෙන යා හැකි බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අපි විශ්වාස කරමු.

ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාව අප විසින් පිළිගන්නා අතර එය සියලු පුරවැසියන්ගේ අභිලාසයන් සපුරන, හානි පැමිණවීම සහ වෛරය වපුරන දේශපාලනය සපුරා ප්‍රතික්ෂේප කරන ව්‍යවස්ථාවක් විය යුතු ය.

තවදුරටත් සියලු පුරවැසියන්, ආගමික නායකයින් සහ දේශපාලඥයින් එක්ව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවාදය සාධනීය සහ වගකිව යුතු අයුරින් පරිණත භාවයකින් යුතුව ඉදිරියට ගෙන යන ලෙස අපි ඉල්ලා සිටිමු.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 05, Sri Lanka
Tel: +94 11 2081384-6, 5552746, 5552748 | Fax: +94 11 2081388 | Email: cpa@cpalanka.org | Web: www.cpalanka.org